දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : 23 /2014,
මගේ අංක:මුලඅධි/විවිධ/2014,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2014.06.25 දින

සියළුම බන්ධනාගාර අධිකාරිවරුන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

<u>බන්ධනාගාර ආයතනවල ඉන්ධන වියදම් පාලනය.</u>

උක්ත කරුන සම්බන්ධයෙන් නිකුත් කර ඇති මාගේ අංක:30/98 හා 1998.08.01 දිනැති චක්‍රලේඛයට අමතරවයි.

02. එම චක්‍රලේඛය මගින් ඔබ වෙත ලබා දී ඇති උපදෙස් අනුගමනය නොකර කටයුතු කර ඇති බව අභ්‍යන්තර විගණන පරීක්ෂණ වලදි අනාවරණය වී ඇත. එබැවින් පහත සඳහන් උපදෙස් අනුව කටයුතු කරන ලෙසට දන්වමි.

03. ඔබ ආයතනයෙන් වෙනත් ආයතනයකට ආරක්ෂණයක් රැගෙන යාමේදි , ඔබ ආයතනයට සමීප ආයතන වෙතින් විමසිම් කර , එම ආයතන වල ආරක්ෂණ තිබේ නම් එම ආරක්ෂණද රැගෙන යාමට කටයුතු කල යුතුය.

04. I. තවද සමහර ආයතන වලින් ආරක්ෂණ තිබෙන බව දන්වා තිබිය දී එම ආරක්ෂණ භාර නොගෙන නොසලකා ඇති අවස්ථාද,
II. එසේම කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය හරහා වෙනත් බන්ධනාගාර වෙත යැවීමට හැකියාව ඇති ආරක්ෂණ බාර නොගැනීම හේතුවෙන් අනවශ්‍ය ලෙස ආරක්ෂණ යොදා ගැනිමට සිදුවූ අවස්ථාද,
III. තංගල්ල, මාතර, ගාල්ල බන්ධනාගාර වලින් ආරක්ෂණ කොළඹට රැගෙන ඒමේදි කළුතර බන්ධනාගරයේ ආරක්ෂණ තිබෙන බව දැන්වුවද, එම ආරක්ෂණ භාරනොගත් අවස්ථා පිළිබඳවද අනාවරණය වී ඇත.

එබැවින් මෙවැනි අවස්ථා ඉදිරියෙදි සිදුනොවීමට අදාළ නිළධාරින් දැනුවත් කර ඒ පිළිබඳව ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරන ලෙස දන්වමි.

05. බ.කො.ජ.චක්‍රලේඛ 30/98 මගින් දන්වා ඇති ආසන්නම ආයතන පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

- කළුතර ,ගාල්ල, මාතර , තංගල්ල
- මොණරාගල, බදුල්ල, තල්දෙන, කුරුවිට
- දුම්බර,පල්ලේකැලේ, කෑගල්ල
- මහර, මීගමුව ,පල්ලන්සේන
- යාපනය,අනුරාධපුරය, වාරියපොළ
- මඩකලපුව,පොළොන්නරුව
- වැලිකඩ, කො.රි.බ.මැගසින්

06. ඉහත සඳහන් බ.කො.ජ.චක්‍රලේඛ 30/98 පිටපතක්ද මේ සමග එවමි.මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුගමනය කරමින් ඉන්ධන වියදම් පාලනය කිරීමට කටයුතු කරන ලෙසත් ,එම චක්‍රලේඛය අවසානයේ දන්වා ඇති පරිදි අදාල වාර්ථාව ඊලග මාසයේ 10 වෙනි දිනට පෙර මා වෙත එවීමට කටයුතු කරන ලෙසත් එසෙම ආරක්ෂණ රැගෙන යාමේ දි අනුගමනය කලයුතු කරුණු සහිත අනෙකුත් චක්‍රලේඛන වලට අනුව කටයුතු කරන ලෙසත් දැනුම්දෙමි.

චන්ද්‍රරත්න පල්ලේගම,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.